(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 387.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 අගෝස්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2687/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කරන අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලය සතු පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පීඨයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට වෙන් කළ ප්‍රතිපාදනවල මුළු වටිනාකම කොපමණද;

(ii) වෙන්කළ ඉහත සඳහන් ප්‍රතිපාදන අදාළ කාල සීමාවේදී එම විශ්වවිද්‍යාලයේ සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් වූයේද;

(iii) කැලණිය විශ්වවිද්‍යාලය සතුව සෑහීමකට පත් විය හැකි තරමට භෞතික සහ මානව සම්පත් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3302/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වීරවිල ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා 2010, 2011, 2012, 2013 යන වර්ෂවල සහ එතැන් සිට අද දක්වා වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කරන්නේද;

(iii) නොඑසේ නම්, එකී ව්‍යාපෘතිය නවතා දැමීමට හේතු කවරේද;

(iv) එකී ව්‍යාපෘතිය අතහැරදැමීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

(v) එකී අලාභය සිදුකිරීමේ වගකීම භාර ගත යුතු පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

(vi) එකී පුද්ගලයින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3908/'13

3\.
ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල නගරයට යාබද දඬුගම ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ව ගාල් සංඛ්‍යාව සහ සත්ව ඝාතකාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රදේශයේ නිරන්තරව එකතු වන ජීව අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ කවරේද;

(iii) එම අපද්‍රව්‍යවලට අදාළව යම් පාරිසරික හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3958/'13

4\.
ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම නිසා වාර්ෂිකව විශාල මිනිස් ජීවිත සංඛ්‍යාවක් අහිමි වන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එසේ අහිමිවූ මිනිස් ජීවිත සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් කාල සීමාව තුළදී අලි - මිනිස් ගැටුම් හේතුවෙන් විනාශ වූ මිනිස් ජීවිත හා දේපළ වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර, මීදිගම රජයේ රෝහලේ විශ්‍රාමික වෛද්‍ය සරත් විමලසූරිය මහතා අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස විදුලි වැටක් නිර්මාණය කර ඇති බවත්;

(ii) මෙම උපකරණය පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමට වනජීවී නිලධාරීන් ලබා ගෙන ඇති බවත්;

(iii) එය මේ දක්වා ආපසු ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වෛද්‍ය සරත් විමලසූරිය මහතා විසින් අඩු වියදමින් නිර්මාණය කරන ලද විදුලි වැට පරීක්ෂා කර බලා එය අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4465/'13

5\.
ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම 2010/2011 වර්ෂයේදී ලැබූ ශුද්ධ අලාභය කොපමණද;

(ii) එම වර්ෂයේ ගිණුම් පිළිබඳව විගණනය කළ වරළත් ගණකාධිකාරීවරුන් වන ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස් ආයතනය විසින් මිහින් ලංකා සමාගමේ පැවැත්ම පිළිබඳව මතයක් ඉදිරිපත් කර තිබේද;

(iii) එසේ නම්, එකී ආයතනය පළ කර ඇති මතයේ "වර්ෂය තුළ මිහින් ලංකා සමාගම රුපියල් මිලියන 940.49 ක අලාභයක් පෙන්වා ඇති අතර, ජංගම වගකීම් රුපියල් මිලියන 1,083.92 කින් ජංගම වත්කම් ඉක්මවා ගොස් රුපියල් මිලියන 3,814.45ක ඍණ ශුද්ධ අගයක් පෙන්නුම් කරන බැවින් සමාගම ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැක සහිත තත්ත්වයක් පෙන්නුම් කරයි." යනුවෙන් සඳහන් වී තිබේද;

(iv) එම තත්ත්වය තුළ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම තවදුරටත් පවත්වාගෙන යෑම සඳහා මහජන මුදල් යෙදවීම ඵලදායක නොවන බව රජය පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4527/'13

6.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් නීත්‍යානුකූල අවසරයක් නිකුත් කරන්නේද;

(ii) එසේ නම්, එකී අවසරය මත මේ වන විට පිහිටුවා ඇති සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(iii) එලෙස පිහිටුවා ඇති සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේදී පිළිපැදිය යුතු නීති රීති මාලාවක් හඳුන්වා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4622/'13

7.

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ තාප බලාගාරය, හම්බන්තොට වරාය, හම්බන්තොට ගුවන් තොටුපල, හම්බන්තොට (සූරියවැව) ක්‍රිකට් ක්‍රීඩාංගනය, ත්‍රිකුණාමලය බලාගාරය සහ සාම්පූර් බලාගාරය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදු කරනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩර් නොකැඳවා ඉහත ව්‍යාපෘතිවලට අදාළ ඉදිකිරීම් විදේශීය පෞද්ගලික ආයතනවලට භාර දීමේ දී විශාල කොමිස් මුදල් ලබා ගැනීම් සිදු වී තිබේද;

(ii) චීන ණය යටතේ ක්‍රියාත්මක වන ඉහත සියලු ව්‍යාපෘතිවලට අදාළ ණය සම්බන්ධයෙන් ගිවිස ගෙන ඇති සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4633/'13

8\.
ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ මුල්ම HIV ආසාදිතයා සොයා ගනු ලැබූ වර්ෂය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)හි සඳහන් දින සිට මේ දක්වා HIV ආසාදිතයන් සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය;

(ii) HIV ආසාදිතයන් සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන්;

(iii) HIV ආසාදනය සඳහා බලපාන ප්‍රධාන කරුණු;

(iv) එම කරුණු පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර;

කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) HIV ආසාදිතයන් අතරින් බහුතරය කාන්තාවන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) HIV ආසාදිත මවකගේ කුස තුළ සිටින දරුවකුට HIV ආසාදනය වීම වළක්වා ගැනීමට ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) මෙම රෝගය ශ්‍රී ලංකාව තුළ පැතිරීමට බලපාන ප්‍රධාන කරුණු කවරේද;

(iv) HIV පැතිරීම වැළැක්වීමට රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4760/'14

9\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීම සඳහා ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

(ii) දියර කිරි මගින් පිටිකිරි නිෂ්පාදනය කිරීම සඳහා ස්ථාපිත ආයතනය කවරේද;

(iii) එම ආයතනයේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයක් සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4906/'14

10\.
ගරු තිස්ස අත්තනායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 ජනවාරි මාසය වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම පාරිතෝෂික මුදල් ලබා ගැනීම සඳහා රැඳී සිටි විශ්‍රාමික රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා දීමේ යම් ප්‍රමාදයක් පවතින්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ට පාරිතෝෂික අත්තිකාරම් ලබා දීම සඳහා වාර්ෂිකව මහා භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2014 අනුව මෙතෙක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ලබා දුන් විශ්‍රාම පාරිතෝෂික අත්තිකාරම් මුදල් ඉදිරියේදී බැංකු මගින් ලබා දීමට කටයුතු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4957/'14

11.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක වන ලියාපදිංචි ලුණු ලේවායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ලුණු ලේවායන් මගින් වාර්ෂිකව නිපදවන ලුණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) පුත්තලම ප්‍රදේශයේ නිපදවන ලුණු ප්‍රමාණය, ජාතික ලුණු අවශ්‍යතාවයෙන් කුමන ප්‍රතිශතයක් සම්පූර්ණ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලුණු නිෂ්පාදන ආයතන සඳහා රජයේ ඉඩම් කුමන හෝ රාජ්‍ය ප්‍රතිපත්තියක් යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ලබා දී ඇති සමාගම්, එක් එක් සමාගමට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම් සඳහා රජයේ තක්සේරු වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රජයේ ඉඩම් ලුණු නිෂ්පාදනය සඳහා ලබා දීමේදී ඇතැම් සමාගම් සඳහා විශේෂ වරප්‍රසාද ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5027/'14

12.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට දේශීය වෙළඳපොළෙහි අළෙවි කරනු ලබන ශක්තිජනක පාන (Energy Drinks) වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාන අතර ඇති දේශීයව නිෂ්පාදනය කරනු ලබන පාන වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ශක්තිජනක පානයන්හි ගුණාත්මකභාවය හා සෞඛ්‍යාරක්ෂිතභාවය තීරණය කරනු ලබන නිර්ණායක කවරේද;

(iv) 2014 වර්ෂ තුළදී ශක්තිජනක පාන සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2688/'12

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට රුහුණ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව හා සේවය කරන අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2012 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයට වෙන්කළ ප්‍රතිපාදනයන්හි මුළු වටිනාකම කොපමණද;

(iii) එම විශ්වවිද්‍යාලය තුළින් සිසුන්ට ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු අධ්‍යාපනයක් ලබාදීම සඳහා වෙන් කළ එම ප්‍රතිපාදනයන් ප්‍රමාණවත්වේද;

(iv) එම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා සාධාරණ වැටුපක් ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3304/'12

14.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1960 සිට 2000 දක්වා වූ දශකවලදීත්, වර්ෂ 2000 සිට 2012 දක්වා කාලයේදීත්, එතැන් සිට මේ දක්වාත් කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලය සඳහා ලබාගෙන තිබූ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් කවරේදැයි එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී විශ්වවිද්‍යාලවලට අන්‍යොන්‍ය පදනමින් විදේශීය කථිකාචාර්යවරුන් බඳවා ගෙන තිබේද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ දෙක තුළ එම බඳවා ගැනීම් සිදු කරන ලද දිනයන් සහ අදාළ විශ්ව විද්‍යාලයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ පීඨයකට හා ශිෂ්‍යයෙකුට වශයෙන් දැරූ වියදම වාර්ෂික පදනමින් කොපමණද;

(ii) මේ වන විට නේවාසික පහසුකම් ලබන විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) එකී පහසුකම් සපයනු ලබන්නේ නොමිලේද, නැතහොත්, යම් ගෙවීමක් මතද;

(iv) නේවාසික පහසුකම් ලබාදීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරාගනු පිණිස භාවිතා කෙරෙන නිර්ණායක කවරේද;

(v) නේවාසික පහසුකම් නොලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා යොදා ඇති විකල්ප වැඩපිළිවෙළ කවරේද;

(vi) සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නවාතැන් ලබාදීම සඳහා යොදා ඇති දීර්ඝ කාලීන ක්‍රමෝපාය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4571/'13

15.

ගරු අනුර දිසානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2011 සිට මේ දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් එක් එක් වරාය වෙත පැමිණි නැව් සංඛ්‍යාව හා හුවමාරු වූ බහාලුම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ ඉහත එක් එක් වරායේ මෙහෙයුම් ලාභය හෝ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමස්තයක් වශයෙන් ඉහත කාල සීමාව තුළ ලැබූ ආදායම හා ලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*2.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*12.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

13.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---